# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2192/63 - 2020 සැප්තැම්බර් මස 11 වැනි සිකුරාදා - 2020.09.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (xv) (A)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

21 වන වගන්තිය සහ 139 වන වගන්තිය සමග කියවිය යුතු 27 (1) වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 (1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය ජී. එල්. පීරිස් වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මේ නියමය මගින්, ඉහත කී පනතේ 139 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, එකී පනතේ 21 වන වගන්තිය යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලබන, ශ්‍රී ලංකාවේ, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පීඨ සහා අධ්‍යයන අංශ නිශ්චිතව දක්වමින්, (2020 ජූලි මස 3 වැනි දින අංක 2182/40 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමය මගින් අවසන් වරට සංශෝධිත පරිදි වූ) 2007 පෙබරවාරි මස 2 වන දින අංක 1482/26 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ උපලේඛනයේ, I වන තීරයේ දක්වෙන "ශාස්ත්‍ර පීඨය" යන අයිතමයට අනුරූපව එම උපලේඛනයේ II වන තීරයේ දක්වෙන "17. මනෝ විද්‍යා අංශය" යන සටහනට ඉක්බිතිව ම පහත දක්වෙන අලුත් සටහන එකතු කිරීමෙන් එකී නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

''18. ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයන අංශය''.

මහාචාර්ය **ජී. එල්. පීරිස්**,
අධ්‍යාපන අමාත්‍ය.

2020 සැප්තැම්බර් මස 08 වැනි දින,
කොළඹ දී ය.

09 - 658

1A - PG 5129 — 520 (2020/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*